# 7 ශ්‍රේණිය
# භූගෝල විද්‍යාව

## ක්‍රියාකාරකම් පත්‍රිකා




## ඒකකය 1
## අප ජීවත්වන පෘථිවි ගෝලය




## මහද්වීප හා සාගර

**1.** පහත සඳහන් ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A, B හා **C** යන අක්ෂර අතුරෙන් මකර නිවර්තනය දැක්වෙන අක්ෂරය කුමක්ද? ..........

ii. D, E හා **F** යන අක්ෂර අතුරෙන් කැස්පියන් මුහුද දක්වා ඇති අක්ෂරය කුමක් ද? ..........

iii. G, H හා **J** යන අක්ෂර වලින් දැක්වෙන රටවල් අතුරෙන් නෝර්වේ රාජ්‍යය දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........

iv. K, L හා **M**යන අක්ෂර අතුරෙන් අයිස්ලන්ත දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........

v. P, Q හා **R** යන අක්ෂර අතුරෙන් රියෝද ජැනෑයිරෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........

vi. X, Y හා **Z** යන අක්ෂර අතුරෙන් නවසීලන්තය දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........

**2.** සුදුසු වචන යොදා පහත දැක්වෙන ඡේදයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

පෘථිවියේ ගොඩබිම බෙදී ඇති විශාලතම ඒකකය මහද්වීප වශයෙන් සලකයි. මහද්වීප අතර පිහිටි ජලයෙන් පිරුණු විශාල ප්‍රදේශ සාගර නමින් හඳුන්වයි. මහද්වීප අතුරින් ............................. විශාලතම මහද්වීපය වන අතර ................................ කුඩාම මහද්වීපය වේ. මුළුමනින්ම උතුරු අර්ධ ගෝලයේ පිහිටි මහද්වීප දෙකක් ලෙස .............................. හා .............................. සැලකිය හැකිය. ඇන්ටාක්ටිකාව

හැරුනු විට මුළුමනින්ම දක්ෂිණාර්ධ ගෝලයේ පිහිටි මහද්වීපය වන්නේ ................................. මහද්වීප යයි. ..................................................... හා ......................................... යන මහද්වීප යුගල පෘථිවියේ බටහිර අර්ධගෝලයේ ව්‍යාප්ත වී තිබේ. මහද්වීප වලින් වෙන්ව පිහිටා තිබෙන දූපත් අතුරින් විශාලතම දූපත වන්නේ ................................ යි. ................................... දූපත අප්‍රිකා මහද්වීපයට අයත් විශාලතම දූපත වේ. සාගර අතුරින් විශාලතම සාගරය වන්නේ ............................................ සාගරයයි. ............................................ සාගරය විශාලත්වයෙන් දෙවන ස්ථානය හිමි කර ගනී. කුඩාම සාගරය වන්නේ ................................ සාගරයයි. ලවණ ජලයෙන් යුත් කුඩා ජල ප්‍රදේශ මුහුදු නම් වේ. ඇතැම් මුහුදු සාගරයක කොටසක් විය හැකි අතර ඇතැම් ඒවා ගොඩබිමින් වට වූ ජලාශය. බෝල්ටික් මුහුද ....................... සාගරයට අයත් වේ. අප්‍රිකාව හා අරාබිය වෙන්වන සීමාවේ ............................ මුහුද පිහිටා තිබේ. .................................. මුහුදෙන් යුරෝපා මහද්වීපය හා අප්‍රිකා මහාද්වීපය වෙන් වේ.

3. පහත සඳහන් ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. A, B හා **C** යන අක්ෂර අතුරෙන් ඕස්ට්‍රේලියා මහද්වීපය දැක්වෙන අක්ෂරය කුමක් ද? ...........

ii. D, E හා **F** යන අක්ෂර අතුරෙන් කළු මුහුද දක්වා ඇති අක්ෂරය කුමක් ද? ..........

iii. G, H හා **J** යන අක්ෂර අතුරෙන් මැඩගස්කර් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද? ............

iv. K, L හා **M** යන අක්ෂර වලින් දැක්වෙන රටවල් අතුරෙන් චීනය දැක්වෙන අක්ෂරය කුමක් ද? ...........

v. P, Q හා **R** යන අක්ෂර අතුරෙන් ග්‍රිනිච් රේඛාව දැක්වෙන අක්ෂරය කුමක් ද? ..........

vi. X, Y හා **Z** යන අක්ෂර අතුරෙන් ටෝකියෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද? ............

5. පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. මේ සඳහා ලෝක සිතියම් පොතක් ආධාර කර ගන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 වි | | | | | | | | | |
| | 3 | | | | 4 රු | | | | | | |
| | | | | | | | | | | 5 චී | |
| 2 අ | | | | | | | | | | | |
| | | | | 1 | | | | | | | |
| | | | | | | | | | | | |
| 2 | | | | | 6 කැ | | | | | | 8 |
| | | | | | | | | | 7 | | |
| | | | 4 | | | | | | | | |
| | | | | | | | 5සෝ | | | | |
| | 7 | | | | | | | | | | |
| | | | | | | | | | | | |

හරහට

1. ඕස්ට්‍රේලියා මහද්වීපයට අයත් රටකි.
2. එක්සත් රාජධානියේ අගනගරයයි.
3. අප්‍රිකා මහාද්වීපයට අයත් දිළිඳු රටකි.
4. ඉන්දියන් සාගරයට අයත් මුහුදු ප්‍රදේශයකි.
5. මොගඩිෂු මෙම රටේ අග නගරයයි.
6. උතුරු ඇමරිකා මහද්වීපයට අයත් රටකි.
7. මහද්වීප අභ්‍යන්තරයේ පිහිටා තිබෙන මුහුදකි.

පහළට

1. දකුණු ඇමෙරිකා මහාද්වීපයට අයත් දිගැටි ස්වරූපයෙන් ව්‍යාප්ත වී තිබෙන රටකි.
2. උත්තරාර්ධගෝලයේ පිහිටි දූපතකි.
3. ඉන්දියන් සාගරයට අයත් දූපත් සමූහයකි.
4. ලෝකයේ විශාලතම රට.
5. ආසියා මහද්වීපයට අයත් රටකි.
6. අත්ලන්තික් සාගරයට අයත් මුහුදකි.
7. මධ්‍යධරණී මුහුද ආසන්නයේ ව්‍යාප්තව තිබෙන රටකි.
8. ග්‍රිනිච් මධ්‍ය දේශාංශය මෙම මහද්වීපය හරහා ගමන් කරයි.